# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2366/25 – 2024 ජනවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා – 2024.01.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී. 277/40.

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

33 වන වගන්තිය යටතේ වූ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 33 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ වන මා විසින්, ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමතය සහිතව, මේ නිවේදනය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රජයේ ඉඩම් කොටස එකී ආඥාපනතේ කාර්යය සඳහා "පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ භූමියක්" ලෙස සලකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ,**
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2024 ජනවාරි මස 08 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන්කළ මුහුදු මහා විහාරය භූමි ප්‍රදේශය**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක පී/06 සින්න පුතුක්කුඩියිරුප්පු ග්‍රාම නිලධාරි වසමේ පොතුවිල් කලාපය අංක 02 යන ගම පිහිටි විසරමුනයි වෙල්ලඩුවකාඩු නැමති ඉඩමට සර්වේයර් ජනරාල් විසින් මැන සාදන ලද අංක අම් 4883 හා 2020.12.17 දින දරන මූලික පිඹුරේ සඳහන්


1A – G 41227 – 07 (2024/01)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. කැබලි අංක 1 දරන කොටසට මායිම්

උතුරට - අංක 1450 දරන මූලික පිඹුරේ සඳහන් කැබලි අංක 01 ද

නැගෙනහිරට - අංක 1450 දරන මූලික පිඹුරේ සඳහන් කැබලි අංක 02 ද
අංක අම් 2431 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 ද

දකුණට - අංක අම් 2431 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 ද

බටහිරට - TP 262928 සහ 263760 පිඹුරේ කැබලි අංක 02 ද

යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර හතරයි, පර්චස් විසිහතයි දශම හතරක් (අක්. 04/, රූඩ් 0, පර්.27.4) හෙවත් හෙක්ටයාර් 1.6880 විශාල ඉඩම ද

2. ඉහත කී අංක අම් 4883 දරන හා 2020.12.17 දින දරන මූලික පිඹුරේ සඳහන් කැබලි අංක 02 දරන කොටස ට මායිම්

උතුරට - TP 260843, PP 6392 පිඹුරේ කැබලි අංක 56, PP අම් 281 පිඹුරේ කැබලි අංක 1 TP 262777, TP 262928 සහ කැබලි අංක 1 සහ කැබලි අංක 2 ද

නැගෙනහිරට - PP අම් 2431 පිඹුරේ කැබලි අංක 1 ද

දකුණට - PP අම් 2431 පිඹුරේ කැබලි අංක 1 ද , PPA 1450 පිඹුරේ කැබලි අංක 2 සහ PP අම් 1292 පිඹුරේ කැබලි අංක 2 ද

බටහිරට - PP අම් 1292 පිඹුරේ කැබලි අංක 2, TP 245241 සහ TP 276964 ද

යන මෙකී මායිම තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර පහයි රූඩ් දෙකයි පර්චස් තිස්නවයයි දශම හතරක් (අක් . 5 රූඩ් 2, පර්චස් 39.4) හෙවත් හෙක්ටයාර් 2.3255 විශාල ඉඩම ද

3. ඉහත කී පිඹුරු අංක PP අම් 4883 හා 2020.12.17 දින දරණ පිඹුරේ සඳහන් කැබලි අංක 03 දරන කොටසට මායිම්

උතුරට - PP A 1450 පිඹුරේ කැබලි අංක 2 සහ PP අම් 2431 පිඹුරේ කැබලි අංක 1 ද

නැගෙනහිරට - PP අම් 2431 පිඹුරේ කැබලි අංක 1 ද

දකුණට - PPA 1450 පිඹුරේ කැබලි අංක 2, PP 2691 පිඹුරේ කැබලි අංක 77594 සහ 77593 ද

බටහිරට - PP 2691 පිඹුරේ කැබලි අංක , 77593 සහ PP 1292 පිඹුරේ කැබලි අංක 2 ද

යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් පහළොවයි දශම නවයක් (අක්.0., රූඩ් 2, පර් 15.9) හෙවත් හෙක්ටයාර 0.2426 ක් විශාල ඉඩම

යන ඉඩම් වලින් සමන්විත වේ.

EOG 01 - 0092

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.